


## නො හැකි

කේ. ඩී. ප්‍රදීප් කුමාර

වසන්තයක් තිබුණා
ඇවිත් ගිය
නමුත් සෘතුවකුත් තිබුණා තමයි
ඇවිත් නතර වෙන්න

මතකයක් තිබුණා
මේ වගේම
වසන්තයත් එක්කම
ඇවිත් නතර වුණා

කාලයත් ගෙවී ගියා හිමිහිට
වසන්තයත් ගිලිහිලා
වැටුණි පොලවට

ඉතිරි වු දෙයක් පමණක් ඇති
පිය සටහනක් නැති මතකයකි
කියන්නටත් ඇත්තේ ඔබට එක
දෙයක් පමණි
වසන්තයකට තවත් වසන්තයක්
වන්නට නො හැකි



boondi.lk

## සමාප්තිය

දිවා කලේ දිවි සටනින්
වෙහෙසුනු ගත සිත හකුලා
අඳුර කැටිව හුදෙකලාව
නිදි පැදුරට වැටෙනා විට

හතර වටින් මා වට කොට
රෑ කලුවර තිරය එලා
මට නොදැනුව මගෙ නෙතු පිය
ඔබ දෑතින් වසාලන්න

කිසිවකු අයිතිය නොපතන
මුඩුබිම තණ පත් උලමින්
නිදැල්ලෙ කුර ගැට මනිනා
ගව රැනක එකෙකු වන්න

මෙතුවක් කල් පොදි බැඳ ගත්
බලාපොරොත්තුවෙ කඳ මලූ
පැටවූ ගැල බැඳි රැහැණින්
මා ගෙල නිදහස් කරන්න

දුක් කරදර රළ පහරින්
බැට කන ඔරු පියල්ලක්ව
ගිරි සයුරේ පොර බදනා
මා හදවත සමහන් කර

සැනසිල්ලේ වෙරල කරා
හබල් ඔරුව පැද යන්නට
ඈත ඉඳන් මග පෙන්වන
පහන් ටැඹට මා යොමන්න

තොරතෝංචියක් නොමැතිව
ආශාවේ රැහි හඬන
අන්ධකාරයේ තනිවුන
මා ගත සිත බිය දුරු කර

බාල වියේ ඇසූ පිරූ
සුරංගනා කතිකාවක
සිහින ලොවට මා ගෙන ගොස්
එක මොහොතක් සතපවන්න

ඒ මොහොතේ මා තනිවී
මා ගත සිත සැහැල්ලූ වී
උස් අහසේ පාවී යන
පුලූන් වලා රොදක් බඳුව

දැහැන්ගතව සිටිනා විට
මගෙ සවනට ඔබ ලංවී
ජීවිතයේ මා ලැබු දෙය
මේ යයි මට කියා දෙන්න

ප්‍රේමවංශ දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා.




## සවුදිවල (මිය)ගිය බිරිඳගෙන් සැමියාට

ජනිත් විතාරණගේ



මහත්තයො හවසට හැමදාම බොනවාද
ලොකු දුවගෙ තනියට අම්මාවත් එනවාද
මද්දුමී දඟ ඇති ඉස්කෝලේ යනවාද
මගේ ගැනත් ඉඳහිට නිකන් හරි ඇහුවාද

වහිනකොට තාමත් ගේ පුරා තෙමෙනවද
මැටි ගඩොල් බිත්තිය පෙඳ පාසි කනවාද
අරගත්තු ණයවල වැල් පොලිය ආවාද
අනේ මට බැරි වෙයි සමාවක් දෙනවාද

තුන්වේල නැතිවත් හිනැහිච්ච හවසට
රණ්ඩුවක් තිබුනත් එක රැයයි දවසට
නගිනකොට පොල් ගස් බලාගෙන හෙමිහිට
මම ඉතිං මැරුණත් ආදරෙයි හරියට

සවුදියේ අහසට පෝය හඳ පෙනුනට
බුදුපිලිමේ හංගන් හොරෙන් මං වැන්දාට
දන්නේ නැහැ දෙයියොත් නැතිවදෝ මේ රට
එන්නේ නැහැ පිහිටට අනේ මගේ කරුමෙට

පොලූ වලින් ගැහුවත් හිතුවේ මං අපි ගැන
පුච්චද්දි අත පය හිතුවේ මම ණය ගැන
සමහරක් දවසට ගහනකොට ලොකු ඇණ
මං දන්නේ නැතුවම යන්න ඇති මගේ පණ